# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,924 — 1970 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා — 1970.9.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනව පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම ... ... ... | 121 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 122 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 121 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — | | |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධූරන්ධර හියු නෝමන් ග්‍රෙගරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සැහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ මැද රට චාරිකාව සඳහා දැනට මහනුවරදී පැවැත්වෙන අපරාධ අධිකරණ වාරයට අමතරව, 1970 ඔක්තෝබර් මස 8 වැනි බ්‍රහස්පතින්දා සිට කුරුණෑගලදී තවත් අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1970 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹදී ය.

9-578

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

### ඉල්ලීම් උසාවිය, පන්විල

පාතදුම්බර පල්ලේ ගම්පහ, මීගම්මන පදිංචි ලීනියකුමාරන් නැගැලැ අජ් පුහාමි ........................................ පැමිණිලිකාරයා.
නොම්මරය : 1617.
එදිරිව
මීගම්මන වියනමුල්ලේ පදිංචි තිබ්බොටුවමුදුනේ ගෙදර ඇබිත්තා සහ තිබ්බොටුවමුදුනේ ගෙදර තන්දිරිස් ............ විත්තිකරුවන්.

මෙයි පහත සඳහන් දේපළවලින් ඉහත කී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1970 ක්වූ ඔක්තෝබර් මස 18 දින 11 පැයට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රු. 320.75ක් ඇතුලු පවුන්ඩේජ් අයකර ගැනීම සඳහා මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේ ගම්පහේ මීගම්මන පිහිටි පොල්ගස් මත්ත නැමැති අ. 1, රූ. 3, ප. 8 වපසරිය ඇති ඉඩමට මායිම් නැගෙනහිරට: එබරු මැවද, දකුණට: රවන්ඔයද, බස්නාහිරට: ගමගෙදර හේතේ මල ඇලද සහ උතුරට: කෙස්කොළ දෙණියේ අජ්ජුගේ වත්තේ මුදුන නොහොත් මුදුනේ කදහිටියද යන මෙකී මායිම තුල ඉඩම සහ එහි තුල පිහිටි ගෙය සම්පූර්ණයෙන් ද වේ.

ආ. ඩ. කුරුප්පුආරච්චි,
මධ්‍යම පළාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1970 සැප්තැම්බර් මස 7 වෙනි දින,
මහනුවර පිස්කල් කන්තෝරුවේදීය.

9-738

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. ජී. පීරිස්.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## දකුණු පළාත

### මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදීය

මාතර, වල්ගම/රණවීර ආරච්චිගේ බබානෝනා.........පැමිණිලිකාරයා.

නොම්මරය: ඇල්. 2185 එදිරිව

(1) මාතර, වල්ගම/කිරුඹර ලියනගේ කරෝලිස් අප්පු සහ තවත් අයෙක් ........................................ විත්තිකාරයෝ.

මෙහි පහත සඳහන් වෙන දේපළවලින් ඉහත කී නඩුවේ 1 හා 2 විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් රු. 1,421.55ක් අයකර ගැනීමට වර්ෂ 1970 ක්වූ ඔක්තෝබර් මස 20 දින සවස 2 ට පටන් ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට නියෙදන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර තුළ වල්ගම යන ගමේ පිහිටි දැල කඩවත්තේ "සී" අක්ෂරය දරණ කැබැල්ලට මායිම්:—උතුරට: රේල් පාර; නැගෙනහිරට: එම ඉඩමේ "ඩී" අක්ෂරය; දකුණට: කැකුණගොඩවත්ත; බස්නාහිරට: එම ඉඩමේ "ඉ" අක්ෂරය යන මායිම් තුළ පර්චස් හයයි දශම හයයි අටයි (අ. 0, රූ. 0, පර්. 6.68).

2. ඉහතකී වල්ගම යන ගමේ පිහිටි කුඩලුවලේවත්ත නොහොත් ඇටඹගහවත්තේ ලොට් නොම්මර 3 කැබැල්ල යන ඉඩමට මායිම්:— උතුරට: නයිපොකුනෙවත්ත; නැගෙනහිරට: පැලරුප්ප සහ සුදු බෝධිය වත්ත; දකුණට: කුඩලුවල කුඹුර; බස්නාහිරට: මෙම ඉඩමේ අංක 1 සහ 2 දරණ කැබලි යන මායිම් තුළ රූඩ් දෙකක් විශාල ඉඩමෙන් නොබෙදූ දෙකෙන් පංගුවයි. (අ. 0, රූ. 2, පර්. 0)

3. ඉහතකී වල්ගම පිහිටි ඇල්කඩ වත්තේ "ඒ" අක්ෂරය දරණ කැබැල්ලට මායිම්:—උතුරට: දුම්රිය පාර; නැගෙනහිරට: එම ඉඩමේ "ඊ" අක්ෂරය; දකුණට: කැකුණගොඩවත්ත; බස්නාහිරට: එම ඉඩමේ "සී" අක්ෂරය යන මායිම් තුළ පර්චස් විසිපහයි දශම හතරයි එකක් විශාල ඉඩමෙන් නොබෙදූ 3/94 පංගුවයි. (අ. 0, රූ. 0, පර්. 25.41)

4. ඉහතකී කනත්තොගොඩ පිහිටි රුක්ගහ කුඹුර යන කුඹුරට මායිම්:—උතුරට: රුක්ගහ කුඹුරේ උඹුමුල්ල; නැගෙනහිරට: රුක්ගහහේන සහ දෙල්ගහ කුඹුර; දකුණට: වෙදහැලිපත සහ දෙල්ගහ කුඹුර; බස්නාහිරට: පැහිලියද්ද, මැකිලියගහ ලියද්ද සහ පරණ රහේන යන මායිම් තුළ වී තුන් පැලක් පමණ විශාල කුඹුරෙන් නොබෙදූ 1/2 පංගුවයි. (දෙකෙන් පංගුවයි)

5. ඉහතකී වල්ගම පිහිටි පඹුරු ගහවත්තේ අංක 1 දරණ කැබැල්ලට මායිම්:—උතුරට: නයිපොකුනෙහේන; නැගෙනහිරට: කුරුඳුවත්ත; දකුණට: කුරුඳුවත්ත සහ ඇටඹගහහේන; බස්නාහිරට: ඇටඹගහහේන යන මායිම් තුළ රූඩ් දෙකයි පර්චස් දහතුනයි දශම පහක් විශාල ඉඩම වේ. (අ. 0, රූ. 2, පර්. 13.5)

6. ඉහතකී කනත්තගොඩ යන ගමේ පිහිටි ලොකු කළුගේවත්තේ බෙදා වෙන් කරන ලද අංක 8 දරණ කැබැල්ලට මායිම්:—උතුරට: අඩිපාර; නැගෙනහිරට: මෙම ඉඩමේ අංක 9 දරණ කැබැල්ල; දකුණට: ඇල්කඩ කුඹුර සහ මෙම ඉඩමේ අංක 7 දරණ කැබැල්ල; බස්නාහිරට: වෙරලගේවත්ත යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දහතරයි දශම එකයි තුනක් විශාල ඉඩම ද වේ. (අ. 0, රූ. 3, ප. 14.13)

මැ. ග. වින්සන්ට්,
මාතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

1970 ක්වූ සැප්තැම්බර් මස 5 දින,
මාතර පිස්කල් කන්තෝරුවේදිය.

9-661

---

# බූදල් නඩු පිළිබඳ දැන්වීම්

### කළුතර දිස්ත්‍රික් උසාවියේදීය

**නයිසයි ආඥාවයි**

තෙස්තමේන්තු නඩු අංක: ටී. 3461 — මිගහතැන්නේ පදිංචිව සිට නැසීගිය ගම්මන ලියනගේ දොන් හෙන්ද්‍රික් අප්පුහාමිගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාත් බලකඩදාසි සඳහා කරන ලද ඉල්ලුම් පත්‍රයේ කාරණාව ගැනයි.

නැසීගිය අය අතර මිගහතැන්නේ පදිංචි ඉපොල්ගහගේ දෝන කාර්ලිනාහාමි ........................................ පෙත්සම්කරු.

සහ

ගම්මන ලියනගේ දෝන ලිසිනෝනා සහ තවත් අය........... ........................................ වගඋත්තරකරුවෝ.

පහල හෙවෙස්සේ පදිංචි ගම්මන ලියනගේ දොන් හැරිසන් කරුණාසේන 9 වැනි වගඋත්තරකාර—පෙත්සන්කරු සහ

(1) මිගහතැන්නේ පදිංචි ගම්මන ලියනගේ දෝන ලිසිනෝනා
(2) පිටිගල උහන්ඔවිට පදිංචි ගම්මන ලියනගේ දෝන මැපිනෝනා
(3) නාගහදොල පදිංචි ගම්මන ලියනගේ දොන් ජිමෝනිස් අප්පුහාමි
(4) මිගහතැන්නේ පදිංචි ගම්මන ලියනගේ දොන් දියෙස් අප්පුහාමි
(5) මිගහතැන්නේ පදිංචි ගම්මන ලියනගේ දොන් බිටන් ධර්මසේන
(6) ඉත්තාපාන හල්වල පදිංචි ගම්මන ලියනගේ දෝන පුංචි නෝනා
(7) මිගහතැන්නේ පදිංචි ගම්මන ලියනගේ දොන් අමරසිරි
(8) ඕවිටිගල පදිංචි ගම්මන ලියනගේ දෝන ජෝසලින් නෝනා
(10) හල්වල පදිංචි ගම්මන ලියනගේ දෝන සෝමවතී
(11) මීගහතැන්නේ පදිංචි ගම්මන ලියනගේ දොන් විල්බට් ........................................ වගඋත්තරකරුවෝ.

මෙම කාරණය 1970 ක්වූ මාර්තු මස 9 වෙනි දින කළුතර දිස්ත්‍රික් නඩුකාර තැන්පත් ඩී. බී. වල්ගම්පාය මහතා ඉදිරිපිට ඉහත කී 9 වැනි වගඋත්තරකාර පෙත්සන්කරු වෙනුවෙන් ඩබ්ලිව්. ඩී. කුලසිරි කාලාවිල නීතිඥතැනද, 2 වැනි සිට 8 වගඋත්තරකරුවන් වෙනුවෙන් හෙක්ටර් ඔබේසේකර නීතිඥ මහතා පෙනී සිටියදී ඉහත කී 9 වැනි වගඋත්තරකාර—පෙත්සම්කරු 22 අගෝස්තු 1969 දින දරණ පෙත්සම සහ දිවුරුම් සහතිකය කියවා බලා

ඉහත කී වගඋත්තරකරුවන් හෝ මෙම බූදලයට සම්බන්ධකම් ඇති වෙනත් අයෙකු හෝ අයවලුන් විසින් 1970 ජූලි මස 21 වැනි දින හෝ එදිනට මත්තෙන් මෙම උසාවියට ඒත්තු යනාකාර සැහෙන විරුද්ධවාදිකම් දක්වා නොසිටියහොත් ඉහත කී 9 වැනි වගඋත්තරකාර පෙත්සන්කරුට එම නැසීගිය අයගේ දරුවෙකු වශයෙන් එම බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාත් බලකඩදාසි භාර කරන්නට යෙදෙන බව මෙයින් ප්‍රකාශ කරන්ට යෙදුනා ඇත.

බී. ඊ. ද සිල්වා,
දිස්ත්‍රික් නඩුකාර තැන.

1970 මාර්තු 9 වැනි දින දී ය.

විරුද්ධවාදිකම් දැක්වීමේ දිනය 21.8.1970 දක්වා දීර්ඝ කරන ලදී.

21.7.1970.

බී. ඊ. ද සිල්වා,
දිස්ත්‍රික් නඩුකාර තැන.

විරුද්ධවාදිකම් දැක්වීමේ දිනය 24.9.1970 දින තෙක් දීර්ඝ කරන ලදී.

21.8.1970.

බී. ඊ. ද සිල්වා,
දිස්ත්‍රික් නඩුකාර තැන.

9-755

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

උපලේඛනය

1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජුනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජුනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.